# සාමාන්‍ය සමයේ පසළොස්වන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන දේව ප්‍රකාශනය

නික්මයාම පොතෙන් ගත් පාඨයකි.

**නික්මයාම 3 : 13 – 20**

"මම වනාහි ස්වයම්භූ නම් තැනැත් වහන්සේ වෙමි."

මෝසෙස් දෙවියන් වහන්සේට කතා කොට, "එසේ නම් මා ඉශ්රායෙල් සෙනඟ වෙත ගොස්, 'නුඹලාගේ පියවරුන්ගේ දෙවියන් වහන්සේ මා නුඹලා වෙත එවූ සේක' යි කී විට ඔවුන් ද උන්වහන්සේගේ නම කුමක්දැ'යි මාගෙන් අසන කල මම ඔවුන්ට කුමක් කියම්දැ"යි ඇසීය. උන්වහන්සේ මෝසෙස්ට පිළිතුරු දෙමින්, "මම වනාහි ස්වයම්භූ නම් තැනැත් වහන්සේ වෙමි. 'ස්වයම්භූ තැනැත් වහන්සේ ඔබ වෙත මා එවූ සේකැ'යි නුඹ ඉශ්රායෙල් ජනයාට කිව යුතුයැ" යි වදාළ සේක. තවද රටත් උන්වහන්සේ මෝසෙස්ට කතා කරමින් මෙසේ වදාළ සේක. ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ද ඊසාක්ගේ දෙවියන් වහන්සේ ද ජාකොබ්ගේ දෙවියන් වහන්සේ ද වන නුඹලාගේ පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබ වෙත මා එවූ සේකැ යි කිව යුතුය. සදහටම මෙය මාගේ නාමය වේ. මතු සියලු පරම්පරාවෝ මේ නාමයෙන් මට ආමන්ත්‍රණය කරති." "නුඹ ගොස් ඉශ්රායෙල් ජනයාගේ ප්‍රජා මූලිකයන් රැස්කොට ඔවුන් අමතා, 'ආබ්‍රහම්ගේ ද ඊසාක්ගේ ද ජාකොබ්ගේ දෙවියන් වහන්සේ වන ඔබේ පියවරුන්ගේ දෙවිඳාණන් වහන්සේ මට දර්ශනය වී කතා කොට, "මම සැබැවින්ම ඔබ වෙත පැමිණ, මිසර වාසීන් ඔබට කරන දේ දිටිමි. එබැවින් ඔබ පීඩා විඳින මිසර දේශයෙන් මා ඔබ පිටත් කොට කානානිවරුන්ගේ හා හිත්තිවරුන්ගේ ද අමොරිවරුන්ගේ හා පෙරිස්සිවරුන්ගේ ද හිව්වරුන්ගේ

හා ජෙබුසිවරුන්ගේ ද දේශය වන කිරෙන් මී පැණියෙන් ඉතිරෙන දේශයකට ඔබ ගෙන එන්නට මම ඉටාගෙන සිටිමි' යි කියන්න. ඔව්හු ද නුඹේ හඬට සවන් දෙනු ඇත. නුඹ ද ඉශ්රායෙල්ගේ ප්‍රජා මූලිකයන් ද මිසරයේ රජු වෙත ගොස් ඔහුට කතා කොට 'හෙබ්‍රෙව්වරුන්ගේ දෙවි ස්වාමින් වහන්සේ අපට හමු වූ සේක. එබැවින් අපගේ දෙවි ස්වාමින් වහන්සේට පුද පූජා ඔප්පු කරන ලෙස, තුන් දවසක ගමනක් පාළුකරයට යන්නට අපට අවසර දෙන ලෙස අපි ඔබෙන් බැගෑපත්ව ඉල්ලමු"යි කියන්න. එහෙත් මිසරයේ රජ තදින් බල කරනු ලැබුවොත් මිස නුඹලාට යන්නට නොදෙන බව මට සහතිකය. මම ද මාගේ බාහු බලය පා මා එහි කරන්නට යන හාස්කම් සියල්ලෙන් මිසරයට පහර දෙන්නෙමි. ඉන්පසු ඔහු නුඹලාට යන්නට අවසර දෙනු ඇත.

දේව වචනය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 105: 1-5, 8-9, 24-25, 26-27

පිළිතුර: සමිඳාණෝ සිය ගිවිසුම සදහට ම සිහි කරන සේක.

ගීය:

සමිඳුන්ට තුති පුදන්න. එතුමන්ගේ නාමයෙන් අයදින්න. ජාතීන් අතරේ එතුමන්ගේ ක්‍රියා පළ කරන්න.

එතුමන්ගේ මෙහෙකරුන් වූ ඉශ්රායෙල් වංශයෙනි, එතුමන් තෝරාගත් ජාකොබ්ගේ දරුවෙනි, එතුමන් කළ පුදුම ක්‍රියා ද එතුමන්ගේ ආශ්චර්යයන් ද එතුමන් දුන් විනිශ්චයයන් ද සිහි කරන්න.

එතුමන්ගේ ගිවිසුම සදහටම සිහි කරන්න. පරම්පරා දහසක් දක්වා එතුමන්ගේ අණ පණත් සිහි කරන්න. ඒ ගිවිසුම එතුමාණෝ ආබ්‍රහම් සමග කළ සේක. ඊසාක්ට ද දිවුරුම් දුන් සේක.

සමිඳාණෝ ඔහුගේ සෙනඟට බොහෝ දරුවන් දුන් සේක. ඔවුන්ගේ සතුරන්ට වඩා ඔවුන් බලවත් කළ සේක. ඔහුගේ සෙනඟට ද්වේශ කරන්නටත්, ඔහුගේ සේවකයන් වංචාවෙන් රවටන්නටත් සමිඳාණෝ මිසර වැසියන් පෙළඹවූ සේක.

එවිට සිය සේවක මෝසෙස් ද තමන් තෝරාගත් ආරොන් ද සමිඳාණෝ යැවූ සේක. ඔව්හු දෙවිඳුන්ගේ බලවත් ක්‍රියා කළෝය. මිසරයේ අසිරිමත් ක්‍රියා කළෝය.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!

"වෙහෙසවන බර උසුලන සියල්ලෙනි, මා වෙත එන්න. මම ඔබට සහනය දෙමි" යි ස්වාමීන් වහන්සේ වදාළ සේක.

ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!

මම සමිඳුන්ගේ උපකාරය උදක්ම බලා සිටිමි.

එතුමන්ගේ වචනය කෙරෙහි බලාපොරොත්තුව තබමි.

ආලේලූයා!

# සුවිශේෂය

මතෙව්තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

මතෙව් 11 : 28–30

"මා ගුණවත් මෘදු නිහතමානී කෙනෙකු වෙමි."

එකල ජේසුස් ස්වාමීන් වහන්සේ මෙසේ වදාළ සේක. "වෙහෙස වන බර උසුලන සියල්ලෙනි, මා වෙත එන්න. මම ඔබට සහනය දෙමි. මා ගුණවත් මෘදු නිහතමානී කෙනෙකු බැවින් මාගේ වියගහ කරට ගෙන මගෙන් ඉගෙන ගන්න. එවිට ඔබට සහනය ලැබෙනු ඇත. මාගේ වියගහ පහසු ය. මාගේ බර ද සැහැල්ලු ය."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.